ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය


| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2016/04/22 |

## 2016 මාර්තු මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (2013=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2016 පෙබරවාරි මාසයේ දී වාර්තා කළ සියයට 1.7 හි සිට 2016 මාර්තු මාසයේ දී සියයට 2.2 දක්වා ඉහළ ගියේය. ආහාර නොවන කාණ්ඩය ලක්ෂ්‍යමය උද්ධමනය කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය. විවිධ භාණ්ඩ හා සේවා (මෝටර් රථ රක්ෂණය); මධ්‍යසාර පාන හා දුම්කොළ; ප්‍රවාහන; සහ රෙදිපිළි හා පාවහන් උප කාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම් මෙම ලක්ෂ්‍යමය ඉහළ යෑම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි වෙනස 2016 පෙබරවාරි මස වාර්තා වූ සියයට 2.6 හි සිට 2016 මාර්තු මස දී සියයට 2.4 දක්වා පහළ ගියේය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සැලකූ විට එම දර්ශකය 2016 පෙබරවාරි සිට 2016 මාර්තු දක්වා සියයට 0.7 කින් පහළ ගියේය. ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් කාණ්ඩයේ අයිතමයන්හි මිල ගණන් පහළ යාම, දර්ශකයේ මෙම මාසික පහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය. එළවළු, සහල්, අමු මිරිස්, පොල් සහ රතු ළූනු මිල ගණන් මෙම මාසය තුළ දී පහළ ගියේය. මධ්‍යසාර පාන හා දුම්කොළ උප කාණ්ඩයෙහි මිල ගණන් මාසය තුළ දී ඉහළ ගියේය. ආහාර නොවන කාණ්ඩයේ සියලුම උප කාණ්ඩ මාසය තුළ දී බොහෝ දුරට නොවෙනස්ව පැවතුණි.


ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම
(2013=100)
%
10.0
8.0
6.0
4.0
2.0
0.0
-2.0
ජන
පෙබ
මාර්තු
අප්‍රේල්
මැයි
ජූනි
ජූලි
අගෝ
සැප්
ඔක්
නොවැ
දෙසැ
ජන
පෙබ
මාර්තු
2015
2016
ලක්ෂ්‍යමය % වෙනස
වාර්ෂික සාමාන්‍ය % වෙනස

**ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම**

**පදනම : 2013 = 100**

| වසර | මාසය | දර්ශක අගය | මාසික % වෙනස | ලක්ෂ්‍යමය % වෙනස | වාර්ෂික සාමාන්‍ය % වෙනස |
|---|---|---|---|---|---|
| 2014 | ජනවාරි | 103.1 | | | |
| | පෙබරවාරි | 103.0 | -0.1 | | |
| | මාර්තු | 103.2 | 0.2 | | |
| | අප්‍රේල් | 104.1 | 0.9 | | |
| | මැයි | 104.9 | 0.8 | | |
| | ජුනි | 106.2 | 1.2 | | |
| | ජූලි | 107.0 | 0.8 | | |
| | අගෝස්තු | 106.4 | -0.6 | | |
| | සැප්තැම්බර් | 106.4 | 0.0 | | |
| | ඔක්තෝබර් | 106.0 | -0.4 | | |
| | නොවැම්බර් | 106.9 | 0.8 | | |
| | දෙසැම්බර් | 108.6 | 1.6 | | |
| 2015 | ජනවාරි | 112.8 | 3.9 | 9.4 | |
| | පෙබරවාරි | 108.9 | -3.5 | 5.7 | |
| | මාර්තු | 107.6 | -1.2 | 4.3 | |
| | අප්‍රේල් | 107.0 | -0.6 | 2.8 | |
| | මැයි | 108.0 | 0.9 | 3.0 | |
| | ජුනි | 109.1 | 1.0 | 2.7 | |
| | ජූලි | 108.9 | -0.2 | 1.8 | |
| | අගෝස්තු | 108.4 | -0.5 | 1.9 | |
| | සැප්තැම්බර් | 108.4 | 0.0 | 1.9 | |
| | ඔක්තෝබර් | 109.2 | 0.7 | 3.0 | |
| | නොවැම්බර් | 112.0 | 2.6 | 4.8 | |
| | දෙසැම්බර් | 113.2 | 1.1 | 4.2 | 3.8 |
| 2016 | ජනවාරි | 112.0 | -1.1 | -0.7 | 2.9 |
| | පෙබරවාරි | 110.8 | -1.1 | 1.7 | 2.6 |
| | මාර්තු | 110.0 | -0.7 | 2.2 | 2.4 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව